# සහභාගිත්ව සංවර්ධන සන්නිවේදනය


**බණ්ඩාර රත්නායක**
**අංශ ප්‍රධාන (වැ.බ.)**
**මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**


**සන්නිවේදනය යනු අදහස් හෝ තොරතුරු වලින් සමන්විත වූ පණිවුඩ පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකු වෙත හුවමාරු කිරීමේ ක්‍රියාදමයයි. දෙදෙනෙකු හෝ ඊට වඩා වැඩි පුද්ගලයින් පිරිසක් අතරේ අදහස්, ආකල්ප, දැනුම, හැඟීම් වැනි දෑ හුවමාරු වීම සන්නිවේදනය වශයෙන් තවදුරටත් අර්ථ දැක්විය හැකිය.**

සන්නිවේදනය වර්තමානයේ මූලික මිනිස් අවශ්‍යතාවයකි. ආහාර, ජලය, ඇඳුම් - පැළඳුම් හා වාතය මෙන්ම සන්නිවේදනය ද අද මිනිසා සඳහා අත්‍යාවශ්‍යම අංගයක් බවට පත්ව තිබේ. ලෝකයේ තොරතුරු තාක්ෂණය දියුණුවත් සමඟම ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්වී ඇති බැවින් වර්තමානය වන විට, තොරතුරු සන්නිවේදනයේ අවශ්‍යතාවය මිනිසාට වඩාත් තීව්‍ර ලෙස දැනෙන්නට පටන් ගෙන තිබේ. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය යන මූලික නිෂ්පාදන සාධක ක්‍රියාත්මක කිරීම වුව ද, තොරතුරු සන්නිවේදනයෙන් තොරව කළ නොහැකිය.


**සියළු දෙනාටම නිදහසේ යම් මතයක් දැරීමට හා එය ප්‍රකාශ කිරීමට හිමිකමක් ඇති බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තිය මගින් සහතික කර ඇත**. මිනිසාට සන්නිවේදනයේ ඇති සමාන අයිතිය අනිකුත් අංශයන් වල ද සමාන බවක් ඇති කිරීම කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් බලපවත්නා වූ මෙවලමක් වේ.

සන්නිවේදනය සහ සහභාගිත්වය යන්න **"එකම කාසියක දෙපැත්ත"** වශයෙන් විස්තර කළ හැකිය. **සහභාගිත්වයක් නොමැති තැන සන්නිවේදනයක් ද නොමැත. එසේම සන්නිවේදනය නොකෙරෙන තැනක සහභාගිත්වයක් ද ඇති නොවේ**. මිනිස් සහභාගිත්වය, මිනිස් බලගැන්වීම හෝ මිනිස් නිදහස යන කාරණා සිදුවීම පිණිස නිරන්තරයෙන්ම මැදිහත් වන්නේ සන්නිවේදන ක්‍රියාදමයයි. මෙම මූලික සිද්ධාන්තය සංවර්ධන ක්‍රියාදමයේ දී නිවැරදි සැලසුම් සකස් කිරීමට, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට හා එම ව්‍යාපෘති ඇගයීමට ද යොදා ගත හැකි සිද්ධාන්තයක් බව අවබෝධ කරගන්නේ කලාතුරකින් කෙනෙකි. සියළුම ආකාරයේ සංවර්ධන ක්‍රියාදමයන් හි යෙදෙන්නන් හට ඒවායේ ආරම්භයෙහි පටන්ම නිවැරදි ඵල ප්‍රයෝජන ලබා ගැනීමට සහභාගිත්ව සන්නිවේදනය තුලින් හැකි වේ. එසේ වන්නේ සහභාගිත්ව සන්නිවේදනය සංවර්ධනයේ **"හදවත"** බඳු වන බැවිනි.

සන්නිවේදන ක්‍රියාදමයේ හදිසි මෙවලමක් ලෙස සහභාගිත්ව සන්නිවේදනය යොදගත යුතු නොවේ. සහභාගිත්ව සන්නිවේදනය සංවර්ධනයට යොද ගැනීමේ මහඟු විභවතාවයක් වර්තමානයේ දක්නට ඇතත් එය සැබෑ අයුරින් යොද ගැනීම පිළිබඳව තවමත් පවතින්නේ බොහෝ දුරට වැරදි මතයන් ය. සංවර්ධන ක්‍රියාදමයේ දී සහභාගිත්ව සන්නිවේදකයාගේ කාර්යභාරය වන්නේ අදහස් දෙන්නා හා අදහස් ලබාගනු ලබන ඉලක්ක කණ්ඩායම අතර මනා අන්තර් ක්‍රියාවලියක් ඇති කිරීම පිණිස පහසුකම් සැපයීමයි.

ඵලදයි සන්නිවේදනය, යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයින් කණ්ඩායමක් විසින් ගනු ලබන උත්සාහයක හෝ කරනු ලබන ප්‍රයත්නයක සාර්ථකත්වය සඳහා බෙහෙවින්ම උපකාරී වෙයි. බොහෝ විට පුද්ගලයින් අතරත් සමාජය අතරත් නොහොඳ නෝක්කාඩු සහ අමනාපකම් ඇතිවන්නේ නිසි සංවාදයක්, සන්නිවේදනයක් නොවන නිසා ය. **සන්නිවේදනය** යන්න Communication යන ඉංග්‍රීසි වචනයෙන් බිඳී ආ වචනයකි. එහි ආරම්භය Communis යන ලතින් වචනයයි. එහි අරුත **"පොදු"** යන්නයි. එකිනෙකා අතර පොදු අවබෝධයක් ඇති කිරීමේ අවශ්‍යතාවය ගොඩනැඟීම සන්නිවේදනය වේ.

සන්නිවේදන ක්‍රියාදමයක් සාර්ථක වීම පිණිස පියවර කිහිපයක් සම්පූර්ණ විය යුතුය. **සන්නිවේදන චක්‍රය** යනුවෙන් හඳුන්වනු ලබන්නේ




ද මෙයයි. **පණිවුඩය යවන්නා,** පණිවුඩය, පණිවුඩය යවනු ලබන මාධ්‍යය, පණිවුඩය ලබන්නා සහ ඔහුගේ ප්‍රතිචාරය එහි දී සිදු විය යුතුය.

මෙම රූප සටහනින් එක්තරා පණිවුඩයක් යම් ලබන්නෙකුට (අසන්නෙකුට) තෝරාගත් මාධ්‍යයක් තුලින් යැවෙන ආකාරය දක් වේ. පණිවුඩය ලබාගන්නා පුද්ගලයා මුහුණ දෙන්නා වූ ගැටළු සහගත තත්ත්වය විසඳ ගැනීම සඳහා උදව් කරනු ලබන්නේ ඔහුගේ ප්‍රතිචාරයයි. එසේම මෙම ලබන්නාගේ ප්‍රතිචාරය සන්නිවේදන ක්‍රියාදාමයේ අරමුණු මුදුන්පත් කර ගැනීම පිණිස ඉවහල් වේ.

සන්නිවේදන ක්‍රියාදාමයක් සාර්ථකව නිම වීමට නම් එම පණිවුඩය අසන්නන්ට අවබෝධ වන ලෙස වඩාත් ඵලදායි අයුරින් අවුලින් තොරව ඉදිරිපත් කළ යුතු වේ. සන්නිවේදනය යනු හැම මෙවලමක්ම බහාලනු ලබන කුණු බාල්දියක් නොවන අතර පණිවුඩය ඉතාමත් පැහැදිලි විය යුතු අතර අරමුණට ඉලක්ක විය යුතුය. එසේම සන්නිවේදන ක්‍රියාදාමයෙහි සාර්ථකත්වයට පණිවුඩය ඉදිරිපත් කරන ආකාරය සහ උච්ඡාරණය කරන ආකාරය ද බල පැවැත් වේ.

එකම පණිවුඩයක් ලබා දීම සඳහා යම් සන්නිවේදකයකු සන්නිවේදන මාධ්‍යයන් කිහිපයක් භාවිතා කළ හැකිය. එසේ නැතිනම් මාධ්‍යයන් කිහිපයක් එක්තැන් කොට භාවිතා කළ හැකි වේ. මෙය **බහු මාධ්‍යය සන්නිවේදනය** ලෙස හඳුන්වනු ලබයි. එහි දී භාවිතා කරන එක් මාධ්‍යයක් ප්‍රධාන මාධ්‍ය විය හැකි අතර අනෙකුත් ඒවා සහායක මාධ්‍යයන් වේ.

යම් කිසි පණිවුඩයක් වඩාත් තීව්‍ර ආකාරයට දක්වීමට අවශ්‍ය වූ විටත්, එක් මාධ්‍යයක් පමණක් භාවිතා කිරීම ප්‍රමාණවත් නොවූ විටත්, සන්නිවේදනයේ දී බහු මාධ්‍ය භාවිතය සිදු වේ. සැම සන්නිවේදන මාධ්‍යයකම ඊට අවේණික වූ ප්‍රබලතා මෙන්ම සීමාවන් ද පවතින බැවින් බහු මාධ්‍ය එළඹුමක් මගින් එක් මාධ්‍යයක ඇති සීමාවන් ජය ගැනීම සඳහා තවත් මාධ්‍යයක ඇති ප්‍රබලතාවන් භාවිතා කළ හැකිය. උදාහරණයක් දක්වන්නේ නම්, වී ගොවිතැනට බලපා ඇති උවදුරක් හඳුනා ගැනීම සඳහා ගොවීන් දැනුවත් කිරීම පිණිස ගුවන් විදුලිය වැනි අඩු වියදමකින් විශාල පිරිසකට ක්ෂණිකව යමක් දන්විය හැකි මාධ්‍ය භාවිතා කළ හැකිය. එම උවදුර සඳහා ගොවීන් විසින් ගත යුතු නිශ්චිත ක්‍රියා මාර්ග දැන්වීමට මුද්‍රිත මාධ්‍ය, රූපවාහිනී මාධ්‍යය හෝ ක්ෂේත්‍ර නිළධාරීන් ලවා ගොවීන් දැනුවත් කිරීම වැනි තවත් සන්නිවේදන මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

**බහු මාධ්‍ය එළඹුමක්, ඒක මාධ්‍ය එළඹුමකට වඩා ඵලදායී වේ.** එසේම කාර්යක්ෂම ය. අප පසිදුරන් මුල් කරගෙන පණිවුඩ ග්‍රහණය කර ගන්නා බැවින් මාධ්‍ය කිහිපයක් මගින් පසිදුරන්ගෙන් කිහිපයක් උත්තේජනය කිරීම නිසා පණිවුඩය ග්‍රහණය කර ගැනීමේ හැකියාව වැඩි වේ. එසේම අසන්නාට එක් මාධ්‍යයක් ඔස්සේ ලැබුන පණිවුඩය ගිලිහී ගිය ද තවත් මාධ්‍යයක් ඔස්සේ එම පණිවිඩය ලබා ගැනීමේ ඉඩකඩ තිබේ. බහු මාධ්‍ය එළඹුමක ඇති අනෙක් ප්‍රබලතාවය වන්නේ පණිවුඩයේ ස්වභාවය අනුව මාධ්‍යය තෝරා ගැනීමට සන්නිවේදකයාට ඉඩකඩ ලැබීමයි.

ප්‍රබලතාවන් මෙන්ම බහු මාධ්‍ය එළඹුමක ඇති සීමාවන් ද හඳුනාගත හැකිය. ඉන් ප්‍රධාන වන්නේ බහු මාධ්‍යය සන්නිවේදනය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීමය. අනෙක් කරුණ වන්නේ මාධ්‍ය නිසි ලෙස සංයෝජනය නොකළ හොත් නියි ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වීමයි. මාධ්‍ය සංයෝජනය කළ යුත්තේ අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයටය. නිදසුනක් වශයෙන් ගතහොත් රථවාහන පැදවීම වැනි කරුණක් සම්බන්ධයෙන් පුහුණුවීම් හා රූප සටහන් ආදිය වැදගත් විය හැකි අතර ගුවන් විදුලිය වැනි මාධ්‍යයක් එතරම් වැදගත් නොවනු ඇත. මාධ්‍ය සංයෝජනයේ දී අවශ්‍ය තරමට පමණක් මාධ්‍ය එක්තැන් කරගත යුතු අතර එසේ නොමැති වුවහොත් ඇතිවන්නේ අනවශ්‍ය ඝෝෂාවක් පමණි.

සන්නිවේදන ප්‍රචාරණ ව්‍යාපාරයක් මනාව සැකසුණ සැලසුමක් අනුව ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. එහි පියවරවල් කිහිපයකි.

i ගැටළුව හඳුනාගන්න.

ii ඉලක්ක ග්‍රාහක කණ්ඩායම හඳුනා ගන්න.

iii නිශ්චිත අරමුණු ඇති කර ගන්න.

iv පණිවුඩය තෝරාගෙන නිර්මාණය කරන්න.

v භාවිතා කරන මාධ්‍ය තෝරාගන්න.

vi අයවැය පිළියෙල කර ගන්න

vii සන්නිවේදන ක්‍රමෝපායයන් තීරණය කරන්න.

viii සැලසුම ක්‍රියාවට නැඟීම සඳහා කළමනාකරණ සැලසුමක් සාද ගන්න.

ix පසුවිපරම හා ඇගයීම සඳහා පිළිවෙලක් සකස් කර ගන්න.

## ප්‍රජා මූලික සන්නිවේදනය

**ප්‍රජා මූලික සන්නිවේදනය යනු ප්‍රජාවට අවශ්‍ය තොරතුරු අවශ්‍ය ආකාරයට ලබා දිය හැකි සහ ලබාගත හැකි සන්නිවේදන ක්‍රියාදාමයකි.** ප්‍රජාවක් ලෙස සංවර්ධනය වීම සඳහා ප්‍රජාව ලබාගත යුතු තොරතුරුත්, ප්‍රජාවේ සිට රාජ්‍ය නිලධාරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත සන්නිවේදනය කළ යුතු තොරතුරුත් බොහෝ ය. ඉහළ සිට පහළට ගලා එන සන්නිවේදන ධාරාවකින් සිදු වන්නේ ප්‍රජාව සහ රජය, නිලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර යම් පරතරයක් ඇති වීමයි. මෙවැන්නකින් බිහිවන පරතරය ප්‍රජා සංවර්ධනයට හානි දයක වන අතරම ප්‍රජාව ප්‍රචණ්ඩත්වය වැනි අන්තවාදී ක්‍රියාමාර්ග වලට තල්ලුවීමට හේතු විය හැකිය. තොරතුරු මදකම හෝ ලැබෙන තොරතුරු ඉහළට සන්නිවේදනය කරගත නොහැකි වීම නිසා හට ගන්නා තත්ත්වය **'සන්නිවේදනයේ මන්දපෝෂණය'** ලෙස හඳුන්වනු ලැබේ.

ජගත් සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදුවන පෙරළි ගැන සලකා බලන විට දැනට ඇති **'සන්නිවේදන තත්ත්වය'** වඩාත් බරපතලය. **අනාගත ලෝකය ප්‍රධාන වශයෙන් බෙදෙනු ඇත්තේ තොරතුරු ඇත්තන් හා නැත්තන් වශයෙනි.** වැඩි තොරතුරු ප්‍රමාණයක් සහ අවශ්‍ය තොරතුරු අවශ්‍ය අවස්ථාවේ දී ලබා ගන්නා ඇත්තන් අනාගතයේ දී වරප්‍රසාදලාභී පන්තිය බවට පත්වනු නිසැකය.

වර්තමානයේ ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් ජාලයන් හරහා ලෝකයේ නාගරික ජන සමූහයන් ඒකරාශී වෙද්දී, අපේ ගැමි ප්‍රජාව වැනි ප්‍රජාවන් තව තවත් තොරතුරු මන්දපෝෂණයට ගොදුරු විය හැකිය. මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා ප්‍රජා මූලික සන්නිවේදන ක්‍රියාදාමයක් කරා යොමු විය යුතුව තිබේ. එසේ නොවුනහොත් තොරතුරු තාක්ෂණයේ අසීරිමත් නිර්මාණයන්, ග්‍රාමීය ප්‍රජාව නාගරික කේන්ද්‍රයන්ගෙන් තවදුරටත් ඈත් කරවන්නක් විය හැකිය.

ප්‍රජා මූලික සන්නිවේදනයේ අනුහස් විදහා දක්වන හොඳම උදහරණය **ෆෝගෝ** (Forgo) දූපතයි. උත්තරාර්ධ ගෝලයට ආසන්න තද සීතලෙන් යුක්ත වූ ෆොගෝ දූපත **කැනඩාවට** අයත්ය. තද සීතලෙන් පීඩා විඳින මෙහි ජනතාව වෙනත් තැනක පදිංචි කරවීමට කැනේඩියානු රජය තීරණය කරන ලදී. එමනිසා, දූපතේ දිගින් දිගටම ජීවත් වීම නිසා සිදුවන අවාසි පිළිබඳව දූපත් වාසීන් දැනුවත් කිරීම සඳහා රූපවාහිනී වැඩසටහනක් නිර්මාණය කිරීම පිණිස ශිල්පීන් පිරිසක් ෆෝගෝ දූපතට යවනු ලැබීය. දූපත් වාසීන් මෙම ශිල්පීන් පිරිසට එක හෙළාම කියා සිටියේ දූපතේ විසීම ආර්ථික වශයෙන් ඵලදයී කරගත හැකි බවයි. අවසානයේ ඔවුන් රූපවාහිනී කණ්ඩායමෙන් ඉල්ලා සිටියේ **'මය උපකරණ අපිට පාවිච්චි කරන්න දෙන්න. අපි අවශ්‍ය විදියට වැඩසටහන නිෂ්පාදනය කරන්නම්. කරුණාකරලා ඒක ගෙනිහිල්ලා කැනේඩියානු රජයට පෙන්වන්න'** යන ඉල්ලීමයි. දූපත් වැසියන්ගේ මතයට ගරු කල රූපවාහිනී ශිල්පීහු දූපතේ විසීම ආර්ථික වශයෙන් ඵලදයි ක්‍රියාවක් නොවේ යන අදහස බැහැර කොට දූපත් වාසීන්ට අවශ්‍ය ලෙස වැඩසටහන නිෂ්පාදනය කිරීමේ ඉඩ සලසා දුන්හ. දූපත් වාසීහු දූපතේ සමාජ - ආර්ථික ජීවිතය යළි පණ ගැන්විය හැකි ආකාරය විස්තර වන ආකාරයට වැඩසටහන නිෂ්පාදනය කලහ. එමනිසා, රජයෙන් ඉටුවිය යුතු යම් කාර්යභාරයකින් පසුව ඔවුන්ට එම දූපතේම යහපත් ආර්ථික තත්ත්වයකින් යුතුව ජීවත් විය හැකිය යන මතයට රජයට කන්දීමට සිදුවිය.

මෙම අත්දැකීම් තුළින් අපට ඉගෙන ගත හැකි පාඩම් කිහිපයකි. එනම්, i. ප්‍රජා මූලික සන්නිවේදනයක අවශ්‍යතාවය මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ ෆොගෝ දූපත් වාසීන් විසින් ය. ප්‍රජා මූලික සන්නිවේදන ක්‍රියාදාමයක අවශ්‍යතාවය

බැහැර සිට ඇති කළ නොහැක. ii. ප්‍රජා මූලික සන්නිවේදන ක්‍රියාදාමයක් දියත් කිරීමට හැකි වූයේ රූපවාහිනී කණ්ඩායම තමන්ගේ මතය බැහැර කොට ප්‍රජාවේ මතයට කන්දීමට එකඟ වූ නිසාය. ප්‍රජාවේ මතයට කන්දීමට මාධ්‍යවේදීන් පුරුදු පුහුණු විය යුතුය. iii. ගොගෝ අත්දැකීම් සාර්ථක වූයේ රජය ප්‍රජාවේ මතයට සවන් දීමට එකඟ වූ නිසාය. ප්‍රජාවට යම් යම් දේ දේශනා කිරීමට වඩා ප්‍රජාව කියන දෙයට සවන් දීම වඩා වැදගත් ය.

### සන්නිවේදකයකු සතු විය යුතු කුසලතා හා ගුණාංග

සාර්ථක සන්නිවේදනය, සන්නිවේදකයා මත රඳී පවතී. එහෙයින්, ඔහු නිතැතින්ම අදාල කුසලතා වලින් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර යහපත් සන්නිවේදකයකු සතු ගුණාංග වලින් ද පිරිපුන් තැනැත්තෙකු විය යුතුය. ඔහු සතු කුසලතා බොහෝ විට සම්බන්ධ වන්නේ පුද්ගල ආකල්ප මුල් කරගත් චර්යාත්මක වෙනස් කිරීම් සඳහා ය. සන්නිවේදකයකු අභිප්‍රේරකයෙකු හෙවත් අන් අය උනන්දු කරවන්නකු බැවින් ඔහු හෝ ඇය පහත සඳහන් ගුණාංග වලින් යුක්ත වීම වැදගත් ය.

ග්‍රාහකයාගේ භෞතික හා මානසික පරිසරය සකස් කිරීම, පිළිගැනීමක් ඇති කිරීම, ග්‍රාහකයින් බැඳීම් වලින් නිදහස් කිරීම, දිරි ගැන්වීම, අගය කිරීම් හා ප්‍රශංසා කිරීම, ග්‍රාහකයන් හඳුනා ගැනීම, සත්‍ය ගරුකවීම හා ග්‍රාහකයනට විවෘත වීම, රහස්‍යභාවය, විෂය කරුණු වලට ක්‍රමයෙන් පිවිසීම, දැනුම හා අත්දැකීම් පෙළ ගැස්වීම්, දෘෂ්‍ය මාධ්‍ය භාවිතය, තම වැරදි පිළිගැනීම, නොදන්නා බව ප්‍රකාශ කිරීම, දැනුම හා කුසලතා වර්ධනයට ක්‍රියා කිරීම, ප්‍රියජනක වීම සහ සුවපහසුවෙන් ක්‍රියා කිරීම, ග්‍රාහකයන් ගැන දැඩි විමසිල්ලෙන් සිටීම, ප්‍රායෝගික වීම, ප්‍රිය මනාප බව සහ ආචාරශීලීව කටයුතු කිරීම, ඉවසීම හා සවන් දීමේ හැකියාව, අවස්ථාවෝචිතභාවය සහ නව උපක්‍රම (අත්හදා බැලීම්) ක්‍රියාත්මක කිරීම එකී ගුණාංග වලින් සමන්විත වේ.

## දහසක් මහ වැව්

සංහිදේ මහා නුග රුක
වැව් බඳේ හැපී කී දුක
ඉරිතලා හඬන ගම්දෙර
හංස ගීතයයි
යකුළු කොට හදේ ශක්තිය
පහර හෙළමු සෙල් කුල මත
බලන් සකි සඳුනි වැව
නිල් සළුව අඳිනවා

දහදියෙන් මහා වැව් බැඳි
යෝධ ඒ මිනිස් පරපුර
අපේ දිරිය ශක්තිය දැක
පාර කියනවා
එරී මිහි ලමැද රන්කිරි
යෝධ ඇළ සොරොව් පුඩුවෙන්
දේශයේ බිළිඳු තොළ රන්
කිරි තවරනවා

කලා වැවේ දිය රැලි මත
ගලා නිල් කැළුම් බුදු නෙත



පිරිත් පැන් වේවි
සීතල දියර ගලනවා
නදී ගිර කුලේ සිර කළ
මහා සිප් මිටින් අරගෙන
පුලතිසි ඉසිවර පෙරමග